# දුටුගැමුණු රජුගේ දේශපාලන සහ ආගමික කාර්යභාරය

සචේතනා මාරසිංහ
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
sachethanamarasinghe1@gmail.com

**සංක්ෂේපය**

අනුරාධපුර රාජධානි සමයේ ලක්දිව පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස දුටුගැමුණු රජතුමා හැඳින්විය හැකි ය. රුහුණු පෙළපතේ පාලකයෙක් වූ කාවන්තිස්ස රජුගේ වැඩිමල් පුත් වූ දුටුගැමුණු රජු තරුණ වියේදී ගොවිතැන් කටයුතු සඳහා කොත්මලේ ප්‍රදේශයට ගොස් ජීවත් විය. පියාගේ ඇවෑමෙන් පසු මව සහ කඩොල් ඇතා ලබා ගෙන සිය බාල සොහොයුරු සද්ධාතිස්ස කුමරා සමග සටන් කොට රුහුණේ පාලකයා බවට පත් විය. මේ කාලයේ රජරට චෝල ආධිපත්‍යයට නතුව පැවතුණි. එළාර නම් දෙමළ පාලකයා සිය සේනාව සමග රජරට පාලනය කරන්නට විය. දුටුගැමුණු රජතුමා රජරට පැවති විදේශ ආධිපත්‍යයෙන් රට මුදවා ගෙන රට එක්සත් භාවයට පත් කර විශාල ශාසනික මෙහෙවරක් කළ බව මූලාශ්‍රය මගින් පැහැදිලි වේ.

දුටුගැමුණු රජුගේ දේශපාලන හා ආගමික වශයෙන් සුවිශේෂී මෙහෙවරක් කළ වැදගත පාලකයෙක්ද යන්න විමසා බැලීම මෙහි අරමුණයි. ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතික මූලාශ්‍රය අධ්‍යයනය මෙහි ක්‍රමවේදය විය. දුටුගැමුණු රජුගේ දේශපාලන කාර්යයන් පිළිබඳව අවධානය යොමු කරන විට ඔහු මුලින්ම රුහුණේ සිටිමින් අනාගත යුද්ධයකට අවශ්‍ය සියලු කරුණු සංවිධානය කරන්නට විය. තව ද ඇත්, අස්, රිය හා පාබල යන චතුරංගනී සේනාව ප්‍රතිසංවිධානය කළේ ය. යුද්ධය සඳහා මහා සූදානමක් ලබමින් එළාර පරාජය කිරීමේ කාර්යයට අනුගත විය. ඒ අනුව දශක ගණනාවක් පැවති සොළී පාලනයෙන් රට මුදවා ගෙන ලක්දිව එක්සේසත් කළේ ය. දුටුගැමුණු රජතුමාගේ ආගමික සේවාවන් විමසීමේදී එතුමාගේ ශාසනික සේවාව අති මහත් බව පෙනී යයි. එළාර පරදවමින් රජරට පාලකයා බවට පත් වූ දුටුගැමුණු රජු දේශපාලනික හා ආගමික වශයෙන් සුවිශේෂී වූ මෙහෙවරක් සිදුකළ ශ්‍රේෂ්ඨ පාලකයෙකු බවට නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද : දුටුගැමුණු රජු, දේශපාලනය, ශාසනික සේවය**